# රග්බි ලෝක කුසලාන ඉතිහාසය

**මේ දක්වා ලෝක කුසලාන රග්බි තරඟාවලි 07ක් පවත්වා ඇති අතර ඉන් නවසීලන්තය සහ ඔස්ට්‍රේලියාව තරඟාවලි දෙක බැගින් ජයගෙන ඇත.**




රග්බි යනු නූතන ලෝකයේ ජනප්‍රිය ක්‍රීඩාවකි. පාපන්දු තරගයක් අතරතුර විලියම් වෙබ් එලිස් නම් පාසල් ක්‍රීඩකයා බෝලය අහුලා ගැනීමෙන් රග්බි ෆුට්බෝල් නිර්මාණය විය. මේ වන විට රටවල් ගණනාවක රග්බි ක්‍රීඩාව ව්‍යාප්තව පවතී.

රග්බි ක්‍රීඩාවේ ලෝක මට්ටමේ ප්‍රමුඛයන් තෝරන ප්‍රධානතම තරඟාවලිය රග්බි ලෝක කුසලානය යි. දිගු ඉතිහාසයක් සහිත රග්බි ලෝක කුසලාන තරඟාවලියේ මුල්ම අදියර පැවතියේ 1987 ඔස්ට්‍රේලියාව හා නවසීලන්තය යන රාජ්‍යයන්ගේ සත්කාරකත්වයෙනි. මුල්ම ලෝක කුසලානය හිමිකර ගත්තේ නවසීලන්තය යි.

රග්බි ලෝක කුසලාන තරඟාවලිය ඇරඹීමට පෙර පැවතියේ ප්‍රාදේශීය ජාත්‍යන්තර රග්බි යූනියන් තරඟ පමණක් වන අතර මුල්ම හා පැරණිතම ප්‍රාදේශීය තරඟාවලිය 1883දී Home Nations ශූරතාවය ලෙසින් එංගලන්තය, අයර්ලන්තය, ස්කොට්ලන්තය, වේල්සය යන රාජ්‍යයන් සම්බන්ධ වී ආරම්භ කර තිබේ. පසුව සංධිස්ථාන කිහිපයක් හරහා ඉල්ලීම්, විරෝධතා මැද අවසානයේ අන්තර්ජාතික රග්බි පාපන්දු මණ්ඩලීය

(IRFB) කමිටු රැස්වීමකදී 10/6ක ඡන්දයෙන් රග්බි ලෝක කුසලාන තරඟාවලිය ඇරඹීමට යෝජනා සම්මත විය.

1987 සමාරම්භක ලෝක කුසලාන තරඟාවලිය සඳහා යෝග්‍යතා පරීක්ෂණයක් නොතිබූ අතර දෙවන තරඟාවලියේ සිට ඒ හා සම්බන්ධ ක්‍රියාවලියක් ක්‍රියාවට නඟන ලදී. වත්මන් ආකෘතිය අනුව සත්කාරක ජාතියෙහි සිට මාසයක් පුරාවට ජාතීන් විස්සක් තරඟ වදින අතර තරඟාවලිය අදියර දෙකකින් පැවැත්වේ. ඒ කණ්ඩායම් අදියර හා පිළිමලුන් පිටුදැකීම අදියර ලෙස වේ. එක් කාණ්ඩයකට කණ්ඩායම් 05ක් සිටින සේ කාණ්ඩ 04කට A,B,C,D ලෙස බෙදන අතර ශ්‍රේණිගත කිරීම් අනුපිළිවලින් එලෙස බෙදීම කරනු ලබයි.

රග්බි ලෝක කුසලාන තරඟාවලිය සඳහා සත්කාරකයින් තෝරා ගැනීමෙහිලා ද අනුගමනය කරන විශේෂ ක්‍රමවේදයක් පවතින අතර සුදුසුකම් සැපරීමක් අවශ්‍ය කෙරේ. තරඟාවලි සංවිධානය සීමාසහිත රග්බි ලෝක කුසලානය (RWCL) මඟින් සිදුකරන අතර සත්කාරක රාජ්‍ය තේරීමේදී IRB සාමාජිකයන් සිය ඡන්දය භාවිත කරයි. මෙතෙක් පැවති සියලුම තරඟාවලි රග්බි ප්‍රධාන ක්‍රීඩාව වූ රාජ්‍යයන්වල පැවැත්විණි. තවද සත්කාරකත්වය ලබා ගැනුමට නම් අවසාන තරගය පැවැත්වෙන ක්‍රීඩාංගණයේ අවම 60,000කට ප්‍රේක්ෂක පහසුකම් තිබිය යුතුය.

මේ දක්වා ලෝක කුසලාන රග්බි තරඟාවලි 08ක් පවත්වා ඇති අතර ඉන් නවසීලන්තය තරඟාවලි තුනක් ජයගෙන රග්බි ලොව ප්‍රමුඛ නාමයක් හිමි කරගෙන තිබේ. අවසාන වශයෙන් මෙම වර්ෂයේ දී (2015) එංගලන්තයේ සත්කාරත්වයෙන් පැවති ලෝක කුසලාන තරඟාවලිය ද ජය ගත්තේ නවසීලන්තයයි.

ඉතාමත් මිල අධික මාධ්‍ය වටිනාකමක් සහිත රග්බි ලෝක කුසලාන තරඟාවලියේ 2007 වර්ෂයේ පැවති තරඟාවලිය බිලියන 4.2ක රූපවාහිනී ප්‍රේක්ෂක අවධානයක් හිමිකර ගැනීමට සමත් විය. එමෙන් ම මේ වන විට ලොව තෙවැන්නට වැඩිම විශාලත්වයෙන් යුතු ලෝක මට්ටමේ ක්‍රීඩා ඉසව්ව රග්බි ක්‍රීඩාව වේ.

**ටී. නොරංජන්**

